සියලුම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved] Eng. Nilupul Sri Sankalpa

නිලුපුල් ශ්‍රී සංකල්ප, නිලුපුල් ශ්‍රී සංකල්ප, Nilupul Sri Sankalpa, Nilupul Sri Sankalpa

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examination,Sri Lanka

ආදර්ශ ප්‍රශ්න පත්‍ර 11
Test Paper 11

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
# General Certificate of Education (Adv. Level) Examination, August 2013

**සංයුක්ත ගණිතය I**
**Combined Mathematics I**

පැය: 1 විනාඩි :45
1 hour & 45 min

**10 S I**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1.(a) $x^2 - px + q = 0$ හි මූල $\alpha, \beta$ නම් $\dfrac{\beta^2}{\alpha}$ සහ $\dfrac{\alpha^2}{\beta}$ මූල වශයෙන් ඇති සමීකරණය ලියන්න. $q = 2$ නම් හා $p^3 - 6p - 6 = 0$ විට, $\alpha, \beta$ හි තාත්වික අගයන් සොයන්න. ඒ නයින් $x^3 - 6x - 6 = 0$ සමීකරණයේ තාත්වික මූලය සොයන්න.

(b). $p, q, r \in \mathbb{R}$ විට, $px^4 + qx^3 + rx^2 - qx + p = 0$ යන සමීකරණය $y$ හි වර්ගජ සමීකරණයකට ඌනනය කල හැකි බව පෙන්වන්න. මෙහි $y = x - x^{-1}$ වේ.

එනයින් $x$ සඳහා තාත්වික මූල තිබීමට $p, q, r$ සපුරාලිය යුතු අවශ්‍යතාවය සොයන්න.

(c). $f(x)$ යනු තුන්වන මාත්‍රයේ බහු පද ශ්‍රිතයකි. එය $(x^2 - 1)$ බෙදූ විට, ශේෂය, $13x + 14$ වේ. එහි $(x+2)^2$ සාධකයක් වේ. $f(x)$ සොයන්න. ඒනයින් $f(x) = 0$ ට තාත්වික සමපාත මූල තුනක් ඇති බව පෙන්වන්න.

2. (a) ගණිත අභ්‍යුහන මූල ධර්මය භාවිතාකර, ඕනෑම $n$ ධන නිඛිල සංඛ්‍යාවක් සඳහා $\dfrac{n^5}{5} + \dfrac{n^3}{3} + \dfrac{7n}{15}$ යන්න නිඛිලයක් බව පෙන්වන්න.

(b). ශ්‍රේණියක සාධාරණ පදය $U_r = \dfrac{1}{r(r+1)(r+2)(r+3)}$ වේ. එය භින්න හා වලට වෙන් කරන්න.

ඒනයින් $U_r = A\left(V_r - V_{r+1}\right) + B\left(V_{r+1} - V_{r+2}\right) + C\left(V_{r+2} - V_{r+3}\right)$ වන අයුරින් $A, B, C$ නියතයන් හා $V_r, V_{r+1}, V_{r+2}, V_{r+3}$ සොයන්න.

$\displaystyle\sum_{r=1}^{n} U_r = \frac{1}{6} - \frac{1}{6(n+1)} + \frac{1}{3(n+2)} - \frac{1}{6(n+3)}$ බව පෙන්වන්න. ශ්‍රේණියේ අභිසාරී වන බව පැහැදිලි කරන්න.

(c) $y = |x+1| - x$ හි දළ ප්‍රස්ථාරය හා $y = 4 - |x-1|$ හි දළ ප්‍රස්ථාර, එකම සටහනලක අඳින්න. ඒනයින් $|x+1| + |x-1| < x + 4$ අසමානතාවය විසඳන්න. $|x+1| + |x-1| = x + 4$ වන $x$ හි අගයන් සොයන්න.

3. (a) $\lim_{x\to 0}\frac{1-\cos(1-\cos x)}{x^4}=\frac{1}{8}$ බව පෙන්වන්න.

(b) $y=\tan^{-1}\left(\frac{2x\sqrt{1-x^2}}{1-2x^2}\right)$ වේ. $z=\sin^{-1}x$ නම්, $\frac{dy}{dz}$ සොයන්න.

(c). දී තිබෙන අරයක් ඇති ගෝලයක් තුල සංවෘත කේතුවක් අන්තර් ගත කරනු ලබයි. කේතුවේ පරිමාව උපරිමයක නම් එය ගෝලයේ පරිමාවෙන් $\frac{8}{27}$ බව පෙන්වන්න.

(d). $f(x)=(x-1)^2(x+1)$ ලෙස ලබා දී ඇත. $f'(x)$ සොයා $f(x)$ හි ස්ථාවර ලක්ෂයන් ගෙනහැර දක්වමින් $y=f(x)$ හි දළ සටහනක් අඳින්න. සපර්ශෝන් මුඛ ලක්ෂ ගෙනහැර දක්වමින් $y=\frac{1}{f(x)}$ හි දළ ප්‍රස්ථාරය අපෝහනය කරන්න.

4. (a) $Cos$ ප්‍රමේය සාධනය කරන්න.

සුපුරුදු අංකනයෙන් $k\in\mathbb{R}$ $(a+b+c)(b+c-a)=kbc$ වේ නම්,

$A$ කෝණයේ අගය $k$ ඇසුරින් සොයන්න. ඒනයින් $k$ ට තිබිය හැකි උපරිම හා අවම නිඛිල අගය සොයන්න. එම එක් එක් අවස්ථාව සඳහා $A$ කෝණයේ අගය සොයන්න.

(b). $f(x)=5\cos^2x-24\sin x\cos x-5\sin^2x+6$ ප්‍රකාශනය $a\cos(2x+\alpha)+b$ ආකාරයට ප්‍රකාශ කරන්න. ඒනයින් සියලු තාත්වික $x$ සඳහා $|f(x)|\le 19$ බව පෙන්වන්න. $0\le x\le 2\pi$ පරාසය තුල $y=f(x)$ හි දළ සටහන අඳින්න. තවද මෙම පරාසය තුල $f(x)=k$ සමීකරණයට

i. විසඳුම් නොතිබෙන්නේ,
ii. විසඳුම් දෙකක් තිබෙන්නේ,
iii. විසඳුම් තුනක් තිබෙන්නේ,
iv. විසඳුම් හතරක් තිබෙන්නේ, $k$ හි කවර අගය පරාසයකට ද?

***

A A A
Nilupul Sri Sankalpa
B.Sc. Eng. (Hon's, Electrical & Electronic)
077-2249927